Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# තනතුරු - ඇබෑර්තු

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ වැඩ ක්ෂේත්‍ර පරිපාලක III පුරප්පාඩු පිරවීම

## කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව

කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ දනට පුරප්පාඩු වී ඇති වැඩ ක්ෂේත්‍ර පරිපාලක III තනතුරට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ට හා දනටමත් තාවකාලික, අනියම් හා ආදේශක සේවයේ නියුතු අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් සම්පූර්ණ කර "ලේකම්, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය" යන ලිපිනයට 2018.07.26 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සහ වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01. | වැඩ/ක්ෂේත්‍ර පරිපාලක III | 01 | MN 1 - 2016<br>රු. 27,140 - 10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45,540<br>(4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි.) | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයක් (06) සමත් වී තිබිය යුතුය.<br>සහ<br>අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) සමත් වී තිබිය යුතුය. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) |

*02. බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය.
2. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
3. අයදුම්කරු බස්නාහිර පළාත තුළ අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වසර 03 ක කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
4. අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 30ට නොවැඩි විය යුතුය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයෙකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩ බලනොපානු ඇත.)
5. සේවා අවශ්‍යතාවය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයන් හා ලිඛිත පරීක්ෂණයන් මගින් සුදුස්සන් තෝරනු ලැබේ.

*03. සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.
2. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.
3. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, බස්නාහිර පළාත් සභාවේ හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද, අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

04. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

1. උප්පැන්න සහතිකය
2. අධ්‍යාපන සහතික
3. අදාළ කාලසීමාව සඳහා පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී සහතිකය
4. මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක්
5. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික
6. වෙනත් සුදුසුකම් දක්වෙන සහතික

*අයදුම්කළ යුතු ආකාරය :*

(1) මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි ( A4 ප්‍රමාණයේ) අයදුම්පත් 2018.07.26 වැනි දිනට පෙර "ලේකම්, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(2) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදළ තනතුර සඳහන් කළ යුතුය

. (3) දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව එවිය යුතුය.

(4) අතින් ගෙනැවිත් භාරදෙන අයදුම්පත් භාර ගනු නොලබන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සැළකිය යුතුයි** : මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ජේ. චාන්දනී ඒකනායක,
ලේකම්,
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව.

2018 ජුනි මස 18 වැනි දින,
ගොතටුව නව නගරය,
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

ආදර්ශ අයදුම් පත්‍රය

**කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ....................................................................තනතුර සඳහා බඳවා ගැනීම***

(1) (අ) මුලකුරු සමග නම :——————————————.
(ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම් :——————————————.
(2) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————————.
(3) ස්ථිර පදිංචි ලිපිනය :——————————————.
(4) දුරකථන අංකය : පෞද්ගලික :—————— නිවස :——————
(5) ස්ත්‍රී/පුරුෂ භාවය :——————————————.
(6) (අ) උපන් දිනය අවුරුද්ද :——————. මාසය :——————. දිනය :——————.
(ආ) අයදුම්පත් භාර ගන්නා දිනට වයසඃ අවුරුදුඃ ☐☐ මාස : ☐☐ දින : ☐☐
(7) ජාතික හැඳුනුම්පත් අංකය :——————————————.
(8) විවාහක/අවිවාහක තත්ත්වය :——————————————.

(9) (අ) ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක්ද ? :——————————————.

(ආ) එසේ නම් උපතින්ද? , ලියාපදිංචි වීමෙන්ද? :——————————————.

(10) අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) :——————————————.

(11) වෘත්තීය සුදුසුකම් :——————————————.

(12) සේවා පළපුරුද්ද :——————————————.

(13) (අ) ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියේ වරදකරුවෙකු කරනු ලැබ තිබේද? :——————————————.

(ආ) එසේ නම් විස්තර :——————————————.

(14) දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු නම් ඒ පිළිබඳ විස්තර

(අ) දැනට දරන තනතුර :——————————————.

(ආ) එම තනතුරට පත් වූ දිනය :——————————————.

(ඇ) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/ආදේශක/ව්‍යාපෘති ) යන වග :——————————————.

(15) වෙනත් සුදුසුකම් :——————————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බවට ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

දිනය :——————————.

——————————.
අයදුම්කරුගේ අත්සන.

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

(රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/රජයේ සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා)

මෙම අයදුම්කරු වන .......................................................................... මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .........................................................................වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැක./නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කරමි./නොකරමි.

.....................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :——————————————.

පදවිය :——————————————.

දෙපාර්තමේන්තුව/අයතනය :——————————————

(නිල මුද්‍රාව යොදන්න.)

දිනය :——————————————.

Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව

කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් සම්පූර්ණ කර "ලේකම්, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය" යන ලිපිනයට 2018.07.26 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන සහ වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01. | කාර්යාල කාර්ය සහායක III ශ්‍රේණිය | 01 | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 (රා.ප.ච. 03/2016 වැටුප් පරිවර්තන වගුව අනුව PL 1 - 2016 වැටුප් පරිමාණයේ 1 පියවර වන රු. 14,234 ආරම්භක වැටුප් පියවර වශයෙන් සැලකේ. ( III ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හය (06) ක් සමත් වී තිබීම. (මින් විෂයයන් පහක් (05) එකවර සමත් විය යුතුය.) |

*02. බඳවා ගැනීම සඳහා වූ පොදු කොන්දේසි :*

(1) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය.

(2) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

(3) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. දැනට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරන සේවකයන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

(4) අයදුම්කරුවන් ඒ ඒ තනතුර ඉදිරියේ දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(5) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

(6) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු කරනු ලැබූවෙකු හෝ රජයේ /පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.

(7) මෙම තනතුරු සඳහා තෝරාගනු ලැබුවහොත් මසක් ඇතුළත නියමිත සුදුසුකම්ලත් රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

*03. සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි :*

(1) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

(2) පත්වීමේ දින සිට වසර 03ක පරිවාස කාලයකට යටත් වන අතර උසස් කරනු ලබන සේවකයින් එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාලයකට යටත් වේ.

(3) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසි වලට අමතරව ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලටද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන නියෝගවලටද, බස්නාහිර පළාත් සභාව හෝ පළාත් පාලන කොමසාරිස් හා කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

*04. අයදුම්කළ යුතු ආකාරය :*

(1) මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි ( A 4 ප්‍රමාණයේ කඩදාසිවල) අයදුම්පත් 2018.07.26 වැනි දිනට පෙර "ලේකම්, කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(2) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය.

(3) දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව එවිය යුතුය.

(4) අතින් ගෙනැවිත් භාරදෙන අයදුම්පත් භාරගනු නොලබන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතික,
3. අදාළ කාලසීමාව සඳහා පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී සහතිකය,
4. මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක්,
5. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික,
7. වෙනත් සුදුසුකම් දක්වෙන සහතික

***සැළකිය යුතුයි*** .- මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ජේ. චාන්දනී ඒකනායක,
ලේකම්,
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව.

2018 ජුනි මස 18 වැනි දින,
ගොතටුව නව නගරය,
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

ආදර්ශ අයදුම් පත්‍රය

**කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ..........................තනතුර සඳහා බඳවා ගැනීම***

(1) *(අ)* මුලකුරු සමග නම :——————————————.
*(ආ)* මුලකුරු වලින් හැඳින්වෙන නම් :——————————————.
(2) *(අ)* ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————————.
(3) *(ආ)* ස්ථිර පදිංචි ලිපිනය :——————————————.
(4) දුරකථන අංකය : පෞද්ගලික :—————— නිවස :——————
(5) ස්ත්‍රී/පුරුෂ භාවය :——————————————.
(6) (අ) උපන් දිනය : අවුරුද්ද :——————. මාසය :——————. දිනය :——————.
(ආ) අයදුම්පත් භාර ගන්නා දිනට වයස : අවුරුදු :——————. මාසඃ——————. දිනඃ——————.
(7) ජාතික හැඳුනුම්පත් අංකය :——————————————.
(8) විවාහක/අවිවාහක තත්ත්වය :——————————————.
(9) *(අ)* ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක්ද ? :——————————————.
*(ආ)* එසේ නම් උපතින්ද? ලියාපදිංචි වීමෙන්ද? :——————————————.
(10) අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) :——————————————.
(11) වෘත්තීය සුදුසුකම් :——————————————.
(12) සේවා පළපුරුද්ද :——————————————.

(13) *(අ)* ඔබ කවරදක හො චෝදනාවක් සඳහා උසාවියේ වරදකරුවෙකු කරනු ලැබ තිබේද? :——————————.

*(ආ)* එසේ නම් විස්තර :——————————.

(14) දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු නම් ඒ පිළිබඳ විස්තර :

*(අ)* දැනට දරන තනතුර :——————————.

*(ආ)* එම තනතුරට පත් වූ දිනය :——————————.

*(ඇ)* එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/ආදේශක/ව්‍යාපෘති ) යන වග :——————————.

(15) වෙනත් සුදුසුකම් :——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

(රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/රජයේ සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා)

මෙම අයදුම්කරු වන ............................................................ මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ............................................................වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැක./නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කරමි./නොකරමි.

....................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :——————————.

පදවි නාමය :——————————.

දෙපාර්තමේන්තුව/ආයතනය :——————————

(නිල මුද්‍රාව යොදන්න.)

දිනය :——————————.

Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් III පුරප්පාඩු පිරවීම

### කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව

කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති මෝටර්රථ රියදුරන් III තනතුරට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ට හා දැනටමත් තාවකාලික, අනියම් හා ආදේශක සේවයේ නියුතු අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත සම්පූර්ණ කර “ලේකම්, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය” යන ලිපිනයට 2018.07.26 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | මෝටර් රථ රියදුරන් III | 08 | PL 3 - 2016<br>රු. 25,790 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990<br>(3 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි.) | *අධ්‍යාපන සුදුසුසකම් :*<br><br>අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව, ඇතුළුව තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයක් (06) සමත් වී තිබිය යුතුය. (එක් වරකදී අවම වශයෙන් විෂයයන් 05 ක් සමත්වීම අනිවාර්ය වේ.)<br><br>*වෘත්තීය සුදුසුකම් :*<br><br>1. පෞද්ගලික/කුලීරථ සහ තාර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර්රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර්රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම හා රිය පැදවීම පිළිබඳව මනා නිපුණතාවයක් තිබිය යුතුය.<br><br>(බඳවා ගන්නා දිනට වසර තුනකට (03) පෙර අවම වශයෙන් "සී" සහ "සී1" වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "බී" පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය..)<br><br>2. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.<br><br>3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුමක් තිබිය යුතුය.<br><br>*කායික සුදුසුකම් :*<br><br>1. අවම උස අඩි පහක් (5) විය යුතුය.<br>2. දිවා කාලයේ හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. |

*02. බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය.
2. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
3. අයදුම්කරු බස්නාහිර පළාත තුළ අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වසර 03 ක කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
4. අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 30ට නොවැඩි විය යුතුය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයෙකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩ බල නොපානු ඇත.)
5. සේවා අවශ්‍යතාවය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයන් හා වෘත්තීය පරීක්ෂණයන් මගින් සුදුස්සන් තෝරනු ලැබේ.

*03. සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.
2. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.
3. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, බස්නාහිර පළාත් සභාවේ හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද, අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

*සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.*

(1) උප්පැන්න සහතිකය,
(2) අධ්‍යාපන සහතික,
(3) පදිංචිය සනාථ කිරීමේ සහතිකය,
(4) මෑතකදී ලබාගත් ග්‍රාම සේවා සහතිකය,
(5) මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්,
(6) වෙනත් සුදුසුකම් දක්වෙන සහතික,
(7) සේවා පළපුරුදුද පිළිබඳ සහතික.

*04. අයදුම් කළ යුතු ආකාරය :*

(1) මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි ( A4 ප්‍රමාණයේ) අයදුම්පත් 2018.07.26 වැනි දිනට පෙර "ලේකම්, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(2) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය

. (3) දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව එවිය යුතුය.

(4) අතින් ගෙනැවිත් භාර දෙන අයදුම්පත් භාර ගනු නොලබන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

***සැලකිය යුතුයි*** .- මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ජේ. චාන්දනී ඒකනායක,
ලේකම්,
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව.

2018 ජූනි මස 18 වැනි දින,
ගොතටුව නව නගරය,
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ..........................තනතුර සඳහා බඳවා ගැනීම***

(1) *(අ)* මුලකුරු සමග නම :——————————.
*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————.
(2) *(අ)* ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————.
(3) *(ආ)* ස්ථිර පදිංචි ලිපිනය :——————————.
(4) දුරකථන අංකය : පෞද්ගලික :—————— නිවස :——————
(5) ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
(6) *(අ)* උපන් දිනය : වර්ෂය :——————. මාසය :——————. දිනය :——————.
*(ආ)* අයදුම්පත් භාර ගන්නා දිනට වයස : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐
(7) ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
(8) විවාහක/අවිවාහක තත්ත්වය :——————————.
(9) *(අ)* ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද ? :——————————.
(ආ) එසේ නම් උපතින් ද? , ලියාපදිංචි වීමෙන් ද? :——————————.
(10) අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) :——————————.
(11) වෘත්තීය සුදුසුකම් :——————————.
(12) සේවා පළපුරුද්ද :——————————.
(13) *(අ)* ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියේ වරදකරුවෙකු කරනු ලැබ තිබේද? :——————————.
*(ආ)* එසේ නම් විස්තර :——————————.
(14) දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු නම් ඒ පිළිබඳ විස්තර :
*(අ)* දැනට දරන තනතුර :——————————.
*(ආ)* එම තනතුරට පත් වූ දිනය :——————————.
*(ඇ)* එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/ආදේශක/ව්‍යාපෘති යන වග) :——————————.
(15) වෙනත් සුදුසුකම් :——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

——————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

(රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/රජයේ සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා)

මෙම අයදුම්කරු වන ........................................................................ මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ......................................................................වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැක./නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කරමි./නොකරමි.

...................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :——————————.
පදවි නාමය :——————————.

දෙපාර්තමේන්තුව/ආයතනය :——————————
(නිල මුද්‍රාව යොදන්න.)
දිනය :——————————.